**සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2020, 2021, 2022 හා 2023**

---

සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනයේ 2020, 2021, 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ හතර සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන කර්මාන්තායතනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. වත්කම් හා වගකීම්වල පැවැත්ම**

කර්මාන්තායතනය විසින් අවසන් වරට පිළියෙල කර විගණනය කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම**<br>**රු.** |
|---|---|
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 74,440,592 |
| ජංගම වත්කම් | 88,511,879 |
| **මුළු වත්කම්** | **162,952,471** |
| බැරකම් | |
| ජංගම බැරකම් | 145,250,281 |
| **ජංගම නොවන බැරකම්** | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 20,881,436 |
| **මුළු බැරකම්** | **166,131,717** |
| හිමිකම් | (3,179,245) |
| මුළු බැරකම් හා හිමිකම | 162,952,472 |
| මුළු ආදායම | 11,120,968 |
| මුළු වියදම | 19,767,822 |
| **අලාභය** | **(8,646,854)** |

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 4 කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 1994 වර්ෂයේ සිට මේ දක්වා සමස්ත මුදල් රේඛීය අමාත්‍යාංශය වෙතින් ලබාදෙනු ලබන අතර ආදායම් හා වියදම් පිළිබඳව සටහන් මුදල් පොත්වල පවත්වාගෙන යනු ලබයි. කර්මාන්තායතනයට අදාළ 2020,2021 වර්ෂ වලට අදාළ මූල්‍ය ප්‍රකාශ සකසා ඇති අතර. කඩිනමින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. 2022, 2023 වර්ෂ වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවතින අතර එහි කටයුතු අවසන් වූ පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1957 වර්ෂයේදී ආරම්භ කරන ලද කන්තලේ සීනි කර්මාන්තායතනය වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 16,320 ක, මොලැසස් මෙට්‍රික් ටොන් 9,000 ක හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9ක නිෂ්පාදන ධාරිතාවයකින් යුක්ත විය. කර්මාන්තායතනයේ පරිපාලනයේ හා මෙහෙයුම්වල පැවති දැඩි අකාර්යක්ෂමතාවය හා අක්‍රමවත්භාවය වැනි කරුණු මත 1994 වර්ෂයේදී 1,133 ක් වූ සියලු සේවකයන්ට පාරිතෝෂික ගෙවමින් සේවය අවසන් කර තිබුණු අතර එතැන් පටන් කිසිම නිෂ්පාදන කටයුත්තක් නොමැතිව කර්මාන්තායතනය වසා දමා තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට රු.3,179,245 ක ඍණ ශුද්ධ වත්කම් තත්ත්වයක්ද නිරීක්ෂණය විය. එසේම 2021 වර්ෂයේදී කර්මාන්තායතනයේ නිෂ්පාදන ඇරඹීමට පෞද්ගලික සමාගම් දෙකක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණද මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීමෙන් මෙම කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිතව පවතී. | මෙම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලික කටයුතු සිදුකර ඇත්තේ මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීමෙනි. ඒ අනුව, මේ සම්බන්ධව කටයුතු කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් බැවින් එම ආයතනයෙන් විමසීම සුදුසු වනු ඇත. | කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු කඩිනමින් කළමනාකරණය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)කන්තලේ සීනි කර්මාන්තායතනය වෙත 1957 වර්ෂයේදී අංක 11212 දරන ගැසට් පත්‍රය මඟින් අක්කර 21233 රූඩ් 2, පර්චස් 30 ක (හෙක්.8,596) ඉඩම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශ විසින් ලබා දී තිබුණු අතර එම ඉඩම් කලාප 4 ක් සඳහා හෙක්ටයාර් 4,887 ක් ද ගොවිපළ, සීනි කම්හල හා නිවාස සංකීර්ණය, යොවුන් සේනාංකය, සරණාගතයන්, කැළෑව, ඇලවල් හා පාරවල් සහ යුධ හමුදා කඳවුරු වෙත ඉතිරි හෙක්ටයාර් 3,709 ක් ද වශයෙන් වෙන්කර භාවිතා කර තිබුණි. වර්තමානයේදී එම භූමි ප්‍රමාණයෙන් අක්කර 500 බැගින් පුද්ගලික ආයතනයකට හා රාජ්‍ය ආයතනයකට පවරා තිබුණද ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | කන්තලේ සීනි කර්මාන්තායතනයට අයත් ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් වන අතර මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විමසීම සුදුසු වනු ඇත. | තම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට රේඛීය අමාත්‍යාංශය විසින් නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ)1999 වර්ෂයේ සිට කර්මාන්තායතනයේ කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවුවද වත්කම් ආරක්ෂා කිරීම සහ අනෙකුත් කාර්යයන් සඳහා පමණක් සාමාන්‍යාධිකාරී ඇතුළු අතීතයේදී වන්දි ලබා ඉවත් වූ සේවකයින් 33 ක් එනම් ආරක්ෂක නිලධාරීන් 3 ක් හා නියාමකවරුන් 15 ක්, රියදුරන් 4ක්, ගබඩාකරුවන් 3 ක්, පොත් තබන්නා ලිපිකරු 6 ක් හා කාර්මික උදව්කරුවන් 2 ක් වර්තමානයේද සේවය කරමින් සිටින අතර 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්හි වැටුප් හා දීමනා, අතිකාල දීමනා සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා පිළිවෙලින් රු.14,822,246 ක්, රු.15,000,761 ක්, රු.16,838,619 ක් හා රු.16,569,952 ක් ගෙවීම්කර තිබුණි. | 1994 මාර්තු 31 සිට මේ වන තෙක් කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවන අතර, පවතින වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා සේවකයින් 230ක් රඳවාගන්නා ලදි. එම සේවකයින් අතරින් කිහිපදෙනෙක් මියගොස් ඇති අතර ඇතැම් සේවකයන් ඉල්ලා අස්ව ඇත. වර්තමානය වනවිට සේවකයින් 33 දෙනෙක් ඉතිරිව ඇත. දැනට ඉතිරිව සිටින සේවකයින්ගේ වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇත. | රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට වගකිවයුතු පාර්ශවයන් විසින් නොපමාව කටයුතු කළ යුතුය. |